**පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**

--------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 22 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 23 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වයට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී යොදාගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.2 රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කොට ඉදිරිපත් කර ඇති බවට සභාවේ මූල්‍ය ප්‍රකාශන සහතික කර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයද සකස් කර නොතිබුණි.

### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වැඩ සැලසුම් 04 ක් සඳහා වටිනාකම රු.563,500 ක් පෙර වර්ෂයේ ප්‍රතිපාදන සලසා තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, මෙම වියදම පෙර වර්ෂවලදී විවිධ ණය හිමියන්ගේ ගිණුමට වියදමක් වශයෙන් කපා හැර තිබුණි. මෙම වැඩ මේ දක්වා සම්පූර්ණ කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි.

(ආ) නිල වාහනය අනතුරට පත්වීම හේතු කොටගෙන සිදුවී තිබූ රු.513,407 ක අලාභය සමාලෝචිත වර්ෂයේදී ද ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

ප්‍රමාණ පත්‍රිකා ආදී අවශ්‍යය සාක්ෂි නොමැතිවීම හේතු කොටගෙන රු. 898,320 ක් වටිනා ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකිවිය.

1.3.5 **නීති, රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | 111 කොටසේ 24 වන වගන්තිය | ආණ්ඩුවේ ගැසට් පත්‍රය අනුව සභාව පිහිටුවා වසර තුනක් ඇතුළත සභාව සතු මහාමාර්ග සහ අතුරු මාවත් පිළිබඳ උපලේඛනය ප්‍රසිද්ධ කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | (i) III අධිකාරය 32 රීතිය | වත්කම්වලට අදාල වරිපනම් බදු තක්සේරු සම්බන්ධයෙන් වූ ලේඛනය නඩත්තු කර නොතිබූ අතර වරිපනම් සහ බදු අයකරගෙන නොතිබුණි. |
| | (ii) IX අධිකාරය 178(3) රීතිය | ප්‍රජාමූල සංවිධාන සහ ග්‍රාමෝදය මණ්ඩල විසින් සිදුකරනු ලබන කොන්ත්‍රාත් වැඩ පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. |
| | (iii) IX අධිකාරය 178(5) රීතිය | ලංසු පත්‍රිකා යැවීම සඳහා සභාපතිවරයා විසින් බලය දුන් නිලධාරියා විසින් එම ලංසු පත්‍රිකා භාරදීම හෝ ලේඛන ගත තැපැලෙන් යැවිය යුතු වුවද ඒවා එසේ යවා නොතිබුණි. |
| | (iv) IX අධිකාරය 180 රීතිය | මුදල් හෝ තොග සඳහා වගකිවයුතු නිලධාරීන් විසින් ඇප මුදල් තැන්පත් කළ යුතු වුවද ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | |
|---|---|
| මු.රෙ. 571 | රු. 39,296 ක් වන වර්ෂ දෙකකට වඩා කල් ඉකුත් වූ තැන්පතු 12 සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 11,550,525 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 6,156,069 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,394,456 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,556,431 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර පෙර වර්ෂයේ ශුද්ධ අතිරික්තය වූ රු.4,280,095 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අවසානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.276,336 කින් වර්ධනය වී තිබුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.21,413,838 ක් වූ අතර එය පෙර වර්ෂයේ කාරක ප්‍රාග්ධනය වූ රු.16,857,407 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.4,556,431 කින් වර්ධනය වී තිබුණි.

### 2.4 ආදායම් පරිපාලනය

#### 2.4.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය ට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විස්තරය | ඇස්තමේන්තුගත | තථ්‍ය | 2015දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| | - | - | - |
| වරිපනම් හා බදු | 4,116,808 | 3,643,767 | 183,756 |
| බලපත්‍ර ගාස්තු | 304,500 | 459,213 | 500 |
| සේවා ගාස්තු | 371,000 | 513,229 | - |
| වරෙන්තු ගාස්තු, දඩ සහ ගාස්තු | 1,200,000 | 4,923,266 | - |
| වෙනත් ආදායම් | 7,787,475 | 6,482,002 | 6,674,710 |

| | | | |
|---|---|---|---|
| ආදායම් ප්‍රදාන | 25,104,657 | 24,672,422 | - |
| | --------------- | -------------- | ------------- |
| එකතුව | 38,884,432 | 40,693,899 | 6,858,966 |
| | ========= | ======== | ======= |

2.4.2 **සන්නිවේදන කුළුනු සඳහා ගාස්තු අයකිරීම**

2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමයන් ප්‍රකාරව සහා බල ප්‍රදේශය තුළ ඉදිකරන ලද සන්නිවේදන කුළුනු 04 ක් සම්බන්ධයෙන් ගාස්තු අයකර ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවට නිරීක්ෂණය විය.

2.4.3 **මුද්දර ගාස්තු**

වර්ෂ 01 සිට 05 ක කාල පරාසයකට අදාලව ඉඩම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්ගෙන් අයකරගත යුතුව ඇති එකතුව රු.5,325,155 ක මුද්දර ගාස්තු අයකර ගැනීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3 **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) උතුරු පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් සභාවට ප්‍රදානය කරන ලද වාහන 07 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර එම වාහන පවරා ගැනීම සම්බන්ධන්යෙන් වසර 01 සිට 05 කාල පරාසයක් තුළදී කටයුතු කර නොතිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය 63 සහ තත්‍ය කාර්ය මණ්ඩලය 54 කි. තවද, පුරප්පාඩු තනතුරු10 ක් සම්පූර්ණ කර නොතිබූ බව නිරීක්ෂණය විය. එය අනෙකුත් කාර්ය මණ්ඩලයේ රාජකාරිවලට බලපා තිබුණි. තවද, එක් සේවකයෙකු වැඩිපුර බඳවාගෙන තිබුණි.

3.2 **වත්කම් කළමනාකරණය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ මාර්ග පුනරුත්ථාපනය සඳහා මිලදී ගෙන තිබූ රු.11,722 ක් වටිනා තාර භාවිතයට නොගෙන සභාවේ වසර තුනක් නිෂ්කාර්යව තිබුණි.

(ආ) සභාව ලංකා බැංකුවේ ජංගම ගිණුමේ තිබෙන රු.17,853 ක ශේෂය වසර 06කට වඩා වැඩි කාලයක් භාවිතයට නොගෙන තිබුණි.

3.3 **ප්‍රමාද වූ ව්‍යාපෘති**

සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබූ ව්‍යාපෘති 02 කට අදාල එකතුව රු.3,383,500 ක මුදලක් සඳහා විවිධ ණය හිමියන් යටතේ ප්‍රතිපාදන සළසා තිබූ අතර සමාලෝචිත වර්ෂ අවසානය දක්වා ඒවා ඉටුකරවීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

3.4 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන ලද කැලි කසල පිළිස්සීම සහ පස්වලින් යටකිරීම යන ක්‍රියාමාර්ග පමණක් සභාව විසින් අනුගමනය කර තිබුණු අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

4 **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

------------------------------------------

**4.1** **අයවැය පාලනය**

---------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු.21,126 සිට රු.235,365 ක පරාසයක විචලනයක් නිරීක්ෂණය විය.

(ආ) ඵලදායි ආකාරයට භාවිත කිරීමට හැකිවන පරිදි සමාලෝචිත වර්ෂයට අදාලව ඇස්තමේන්තු සකස් කර නොතිබු අතර ඇස්තමේන්තු මනාව සැලසුම් කර නොතිබුණි. එබැවින් අයවැයගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර රු.142,229 සිට රු.3,723,266 ක පරාසයක විචලනයන් නිරීක්ෂණය විය.

4.2 **විගණන කළමනාකරණ කමිටු රැස්වීම**

-------------------------------------------

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂයේ වැඩ කටයුතු කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් අවම වශයෙන් පැවැත්විය යුතුය. කෙසේ වුවද, එකම රැස්වීමක්වත් පවත්වා නොතිබුණි.

4.3 **නොවිසඳුණු විගණන විමසුම්**

---------------------------------

කි.මී.7279 ක දුරක් ධාවනය සඳහා රු.109,573 ක වටිනා ඩීසල් ලීටර් 921 ක් වැය කරමින් සභාපතිවරයාගේ පෞද්ගලික ගමන් සඳහා සභාවේ වාහනය 2012 ජනවාරි 01 සිට 2012 ජූනි 25 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා භාවිත කර තිබු අතර වසර 03 ක් ගතවී තිබුණද ඒ සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

i. හිඟ ආදායම් අයකර ගැනීම
ii. වාහන උපයෝජනය
iii. කොන්ත්‍රාත් පරිපාලනය
iv. ආදායම් ලේඛන
v. සේවක මණ්ඩල අධීක්ෂණය